# ජෝන් ක්‍රිසොස්තම් තුමාගේ ලේඛනවල අන්තර්ගත දිළිඳුකම හා සාධාරණත්වය

පී. එම්. එස්. ඇන්ජලා[1]

මේ පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ අසාධාරණත්වය හේතු කොටගෙන උත්පාදගත වන දිළිඳුකම පිළිබඳ ව කිතුනු දැක්ම ජෝන් ක්‍රිසොස්තම් තුමාගේ ලේඛන ඇසුරින් විමසීම යි. සාධාරණය ඉෂ්ට නොවීම නිසා දිළිඳුකම ඇති වේ. මේ පිළිබඳ ව සමස්ත ආගමික ලෝකයත්, විවිධ කාලවකවානුවල විවිධ පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් කථා කළ ද සමාජ සාධාරණත්වය හමුවේ දිළිඳුකම තුරන් කිරීම හුදු වචනවලට පමණක් සීමා වූවක් බවට පත් වී ඇත. එබැවින් සාධාරණත්වය හා දිළිඳුකම පිළිබඳ ව ජෝන් ක්‍රිසොස්තම් තුමාගේ දේව ධාර්මික සංකල්ප මෙහි මූලික අන්තර්ගතය යි. ජෝන් ක්‍රිසොස්තම් තුමා සාධාරණත්වය හා දිළිඳුකම පිළිබඳ දක්වන සංකල්ප, බයිබලීය දැක්මත් සමඟ ගැළපෙන්නේ ද? යන්න විමසීම පර්යේෂණ ගැටලුව ලෙස දැක්විය හැකි ය. මේ අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි ආදි සාහිත්‍යික මූලාශ්‍රය මඟින් දත්ත ලබාගැනීම යි. මාතෘකාවට අදාළ වූ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි අධ්‍යයනය කරමින් ඒවායේ අඩංගු කරුණු විශ්ලේෂණය කර සමාජගත කිරීමෙන් තොරතුරු ඒකරාශී කොට ඇත.

**මූලික පදඃ** ස්තෝත්‍ර ගීතය, සදාචාරය, සාධාරණය, ක්‍රිසොස්තම්තුමා, බයිබලීය දැක්ම

---

[1] බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයනාංශය